# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2016.10.21

වේලාව : පෙ.ව. 09.00

ස්ථානය : ප්‍රධාන ලේකම් කාර්යාලය, බස්නාහිර පළාත.

## සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය :

1) එම්.ඒ.බී. දයා සෙනරත් මයා - ප්‍රධාන ලේකම් (බ.ප).
2) වී. රාජපක්ෂ මිය - ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප).
3) හේමන්ත සමරකෝන් මයා - සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප).
4) චන්ද්‍රානි සමරකෝන් මිය - ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප).
5) එස්.ජී. විජයබන්දු මයා - ලේකම්, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය (බ.ප).
6) ටී.වී.ඩී.ඩී.එස්.කරුණාරත්න මෙය- ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප).
7) එන්.නිල්වල මයා - ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප).
8) එම්.කේ.කේ.ආර්.අබේදීර මිය - ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය(බ.ප).
9) කේ.කේ. චම්පිකා කනේරු මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන).
10) සිරිසෝම ලොකුවිතාන මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු).
11) බන්දුල ප්‍රේමකුමාර මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය).
12) ඩබ්.එම්.ඩී.එන්.රණසිංහ මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු).
13) ඩී.එම්.එන්.දිසානායක මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්).
14) කේ.එන්.සූරියආරච්චි මිය - සහකාර ප්‍රධාන ලේකම් (පාලන).

**ලේකම්වරුන් විසින් පහත කරුණු පිළිබඳ ව සාකච්ඡා කළ අතර, පහත දක්වා ඇති තීරණයන් ට එළඹෙන ලදි.**

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | සංගණන දිනය පිළිබඳ දැනුවත් කිරීම. | 2016.11.17 දිනට යෙදෙන "සංගණන දිනය" වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන, සංඛ්‍යාලේඛනඥ විසින් ඉදිරිපත් කරන ලදි.<br><br>සංගණන පිළිබඳ සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා පුහුණු සැසියක් නොවැම්බර් 04 වන දින පැවැත්වීමට කටයුතු යොදා ඇති බව වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)<br><br>සංඛ්‍යාලේඛනඥ (සැලසුම්) |
| 02. | බස්නාහිර පළාත් සභා කාර්යාල එකම භූමියක ස්ථාපිත කිරීම. | බත්තරමුල්ල නව පරිශ්‍රයේ රථ වාහන ගාල් කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති වීම හා ඒ සඳහා තෝරා ගත් විකල්ප ස්ථාන සම්බන්ධව අධීක්ෂණය කර, වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා සභා ලේකම්ගේ සභාපතිත්වයෙන් හා ඉඩම් කොමසාරිස්, කඩුවෙල නාගරික කොමසාරිස්, ව්‍යාපෘති ඉංජිනේරු නදීරා මහත්මියගේ සාමාජිකත්වයෙන් යුතු වූ කමිටුවක් ප්‍රධාන ලේකම් විසින් පත් කරන ලද අතර, කමිටු වාර්තාව මසක් තුල ලබා දීමට තීරණය විය.<br><br>නව පරිශ්‍රය සඳහා නියත වශයෙන් ම ඉඩ පහසුකම් ලබා දී ඇති කාර්යාල සම්බන්ධව ඉංජිනේරු අංශයේ තාක්ෂණික කාර්යය මණ්ඩලය සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව ලේකම්වරුන් දැනුවත් කිරීමට කටයුතු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය. |
| 03. | තාක්ෂණ සේවයේ නිලධාරීන් බඳවා ගැනීම. | තාක්ෂණ සේවයේ නිලධාරීන් බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර, සති 2ක් තුල එය පුවත්පත් දැන්වීමක පල කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම.<br><br>ළඟම පාසල හොඳම පාසල වැඩසටහන සඳහා තාක්ෂණ නිලධාරීන්ගේ හිඟයක් පවතින බැවින්, පළාත් පාලන දෙපාර්තමේන්තුව සතු තාක්ෂණ සේවයේ නිලධාරීන් වසරක කාල සීමාවක් සඳහා අනුයුක්ත කර ගැනීමට කටයුතු කිරීම.<br><br>ගෘහ නිර්මාණ ශිල්පීන් 2017 වසරේ බඳවා ගැනීම සඳහා මූලික කටයුතු ආරම්භ කිරීම.<br><br>තවද, යුධ හමුදාවේ තාක්ෂණික නිලධාරි ලෙස කටයුතු කළ, යුද්ධයේ දී ආබාධිත වූවන් තාක්ෂණික නිලධාරීන් ලෙස, යොදා ගැනීමට සාකච්ඡා වී ඇති බව ද, ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)<br><br>ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය.<br><br>ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව. |

| | | | |
|---|---|---|---|
| 04. | තොරතුරු තාක්ෂණ සේවයේ සහකාර අධ්‍යක්ෂ තනතුර. | ප්‍රධාන ලේකම් කාර්යාලයේ තොරතුරු තාක්ෂණ සහකාර අධ්‍යක්‍ෂ තනතුර සඳහා සුදුසු පුද්ගලයෙකු බඳවා ගැනීම සඳහා, බඳවා ගැනීම් පටිපාටිය ඔක්තෝබර් 31 වන විට අවසන් කර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යැවීම හා ඉන් අනතුරුව පුවත්පත් දැන්වීම පල කිරීම සඳහා කටයුතු කළ යුතු බව ප්‍රධාන ලේකම් දැනුම් දෙන ලදී. | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 05. | නව වාහන මිල දී ගැනීම. | රාජ්‍ය භාණ්ඩාගාරය වෙත අවශ්‍ය වාහන පිළිබඳ දැනුම් දීම සඳහා අත්‍යවශ්‍ය වන වාහන හඳුනාගෙන එවන මෙන් ප්‍රධාන ලේකම් සියලු අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත දන්වා සිටින ලදි. | අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>සභා ලේකම්.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 06. | නිල නිවාස පිළිබඳ කාර්ය සාධන බලකාය. | නිල නිවාස මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම සඳහා පුවත්පත් දැන්වීම පල කිරීම.<br><br>නාරාහේන්පිට ඇති රජයේ ඉඩම පිළිබඳ තොරතුරු ආණ්ඩුකාර ලේකම් වෙතින් ලබා ගෙන, එම ඉඩම පළාත් සභාව වෙත ලබා ගැනීමට ඉදිරි කටයුතු සිදු කරන ලෙස ප්‍රධාන ලේකම් දැනුම් දෙන ලදි.<br><br>එහි දී ඉදි කිරීමට නියමිත නව නිල නිවාසයක ඇතුළත් විය යුතු මූලික අංග පිළිබඳ ව අදහස් ඉදිරිපත් වූ අතර, එක් නිවෙසක සැලැස්ම සකස් කර, ඊළඟ රැස්වීමේ ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දෙන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය).<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන).<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු). |
| 07. | සංවර්ධන වැඩසටහන් සහ ප්‍රගති සමාලෝචනය. | නොවැම්බර් මස 4,5,6 දිනයන් හී දී, ත්‍රිකුණාමලයේ දී පැවැත්වීමට නියමිත අයවැය ප්‍රගති සමාලෝචන රැස්වීම සඳහා හොඳ සූදානමක් සහිත ව ලේකම්වරුන් පැමිණිය යුතු වීම.<br>2017 සංවර්ධන සැලැස්ම සැකසීම සඳහා පසුගිය වසරේ සැලැස්මේ සංරචක පාදක කර ගෙන නි.ප්‍ර.ලේ.(සැලසුම්) විසින් යොමු කරනු ලබන ආකෘති පත්‍රය අනුව සැලැස්ම සකසා එවීමට කටයුතු කිරීම.<br><br>සංවර්ධන කටයුතු වල ප්‍රගතිය පිළිබඳ ව සෑහීමට පත් විය නොහැකි බැවින්, ඉදිරියේ දී සැලසුම් අනුමත කිරීමේ දී සිදු වන ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා යෝජනා අනුමත කිරීමේ බලය ලේකම්වරුන් වෙත පවරන බව.<br><br>මුල්‍ය රීති 80ට යටත් ව, සැලසුම් කමිටුව පිහිටුවීම හා අවශ්‍ය උපදෙස් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත නිකුත් කිරීම. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |

| | | | |
|---|---|---|---|
| 08. | භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම. | පළාත් නිල වෙබ් අඩවිය සම්බන්ධ කටයුතු මේ වන විට තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ආයතනය මඟින් සිදු කරන අතර, එහි පසු විපරම් කටයුතු සිදු කර, 2016.11.30 දින වන විට ප්‍රගති සමාලෝචනයක් ඉදිරිපත් කිරීම.<br><br>පළාත් සභාවේ භාෂා පරිවර්තකයන් සඳහා අනුමත කාර්යය මණ්ඩලය පිළිබඳ ව සොයා බලා පුරප්පාඩු සංඛ්‍යාව සති 2ක් තුල පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන ලෙස දන්වන ලදි.<br><br>ඊට අමතරව වෙනත් විමසීම්, වෙබ් අඩවි සංවර්ධනය සහ තොරතුරු පනත ක්‍රියාත්මක කිරීම සඳහා ත්‍රෛ භාෂා නිලධාරීන් අවශ්‍ය වන බැවින්, අවශ්‍යතාව නිවැරදිව හඳුනාගෙන එම තනතුරු ඇති කර ගැනීම. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 09. | තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම | තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා පනත පිළිබඳ පූර්ණ අවබෝධය ලබා තිබීම.<br><br>ප්‍රධාන ලේකම් කාර්යාලයේ තොරතුරු පනත ක්‍රියාත්මක කිරීමේ ආදර්ශ කාර්යාලය ලෙස ඉංජිනේරු අංශය තෝරා ගත් බවත්, ඒ සඳහා එම අංශය දැනටමත් සූදානම් වන බවත්, ප්‍රධාන ලේකම් පැවසීය.<br><br>තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව වෙත දන්වා යැවීමට හැකි වන පරිදි අභියාචනා නිලධාරියකු, තොරතුරු නිලධාරියෙකු සහ සහාය නිලධාරියෙකු පත් කර නොවැම්බර් 01ට පෙර ප්‍රධාන ලේකම් වෙත යොමු කිරීමට කටයුතු කිරීම. පාසල් සහ ඉතා කුඩා ආයතන සම්බන්ධයෙන් තොරතුරු නිලධාරීන් හා අභියාචනා නිලධාරීන් වශයෙන් පත් කරන්නේ කුමන නිලධාරීන් ද යන්න තීරණය කිරීම අමාත්‍යාංශ ලේකම් විසින් කළ යුතු බව ද, සෑම ආයතනයක් ම ආවරණය වන ක්‍රමවේදයක් සැකසිය යුතු බව ද, දැනුම් දෙන ලදි.<br>තොරතුරු සූචිය සැකසීම දෙසැම්බර් 31ට පෙර නිම කිරීම සඳහා කටයුතු කිරීම. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන් |

| | | | |
|---|---|---|---|
| 10. | E-recording (SLT Server / Cloud Server) සහ බස්නාහිර පළාත් වෙබ් පිටුව | බස්නාහිර පළාත් සභාව තුල තොරතුරු තාක්ෂණය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මහේෂ් පෙරේරා මහතා ද, සහභාගී විය. එහි දී ප්‍රධාන වශයෙන් බස්නාහිර පළාත් අමාත්‍යාංශ, ආයතනවලට ලබා දෙන සේවාවන් වැඩිදියුණු කිරීමට තොරතුරු තාක්ෂණය යොදා ගැනීම සම්බන්ධව අවශ්‍යතා විශ්ලේෂණය (need analysis) හා ක්‍රියාත්මක කිරීම සඳහා පරතරය විශ්ලේෂණය (gap analysis) කිරීම වැනි කරුණු පිළිබඳ අවධානය යොමු කරන ලදි.<br>ඒ සඳහා සුදුසු සම්පත්දායකයන් ද සහභාගී කරවා ගනිමින්, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 26ම තමන්ගේ සේවා සැපයීම හා අවශ්‍යතා හඳුනා ගැනීමට අවස්ථාව සලසා යෝජනා ලබා ගැනීමට තීරණය විය. එසේම, සියලු දෙනා කැඳවා පොදු අරමුණු පැහැදිලි කිරීමට රැස්වීමක්, ඉදිරියේ දී සංවිධාන කිරීම කළ යුතු බව ද, තීරණය විය.<br><br>බස්නාහිර පළාතේ ආයතන වලින් ලබා දෙන සේවාවන් වැඩිදියුණු කිරීමට තොරතුරු තාක්‍ෂණය යොදාගැනීම පිළිබඳ මඟ පෙන්වීම සඳහා වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්, එන්. නිල්වල මහතාගේ සභාපතිත්වයෙන් යුක්තව, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් වන චම්පිකා කනේරු, සිරිසෝම ලොකුවිතාන, බන්දුල ප්‍රේමකුමාර, නිමල් රණසිංහ යන මහත්ම මහත්මීන් සහ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ ජගත් ප්‍රියන්ත මහතාගෙන් සමන්විත කමිටුවක් පත් කරන ලදි. කමිටු වාර්තාව 2016.11.30 දිනට පෙර ලබා දීමට ද, තීරණය විය. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 10. | "ජනපතිට කියන්න" වැඩසටහන | "ජනපතිට කියන්න" වැඩසටහන යටතේ 2016.10.21 දින වන විට පළාත් පාලන දෙපාර්තමේන්තුවට ලැබී ඇති ගැටලු 192න් 6ක් සඳහා පමණක් විසඳුම් ලබා දී ඇති බැවින්, වහාම ප්‍රගතිය වාර්තා කිරීම. | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය. |
| 11. | සංග්‍රහ දීමනා වැඩි කිරීම. | ලේකම්වරුන්ට ගෙවනු ලබන සංග්‍රහ දීමනාව ප්‍රමාණවත් නොවන බව යෝජනා වී ඇති බැවින්, එම මුදල ඉහල දැමීම සලකා බැලීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ සභාපතිත්වයෙන් යුක්තව පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) සාමාජිකත්වයෙන් යුතු කමිටුවක් පත් කිරීම හා 2016.11.30 දිනට ප්‍රථමයෙන් ප්‍රධාන ලේකම් වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය<br><br>ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |

<u>**නව යෝජනා**</u>

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01 | ආණ්ඩුකාර ලේකම්තුමා වෙත ලිපි යොමු කිරීමේ දී නිසි ධුරාවලිය අනුව යොමු කිරීම. | සෘජුවම අමාත්‍යාංශ මඟින් ආණ්ඩුකාර තුමා වෙත යොමු කිරීමට අවසර ලත් ලිපි, අමාත්‍යාංශ ලේකම්වරයා ගේ අත්සනින් හෝ අමාත්‍යාංශ ලේකම්වරයා ගේ නිසි අනුමැතිය ලබා ගෙන අත්/කළේ ලෙස සඳහන් කරමින් අදාළ මාණ්ඩලික නිලධාරීන්ගේ අත්සනින් යුක්තව සහ<br><br>ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් ආණ්ඩුකාරතුමා වෙත යොමු කරනු ලබන ලිපි ප්‍රධාන ලේකම්වරයාගේ අත්සනින් හෝ ප්‍රධාන ලේකම්වරයාගෙන් නිසි අනුමැතිය ලබා ගෙන අත්/කළේ ලෙස සඳහන් කරමින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්/අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) ගේ අත්සනින් යුක්තව යොමු කිරීමට කටයුතු කිරීම. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>සියලු ම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් |
| 02. | බස්නාහිර පළාත් විගණන විමසුම සම්බන්ධ ආණ්ඩුකාර ලේකම් විසින් යොමු කරන ලද ලිපිය. | ආණ්ඩුකාර ලේකම් විසින් යොමු කරන ලද වාර්තාවට අනුව, ප්‍රධාන ලේකම් වෙත වර්තමාන ප්‍රගතිය ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>සියලු ම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් |